# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1253 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 05/10/2023 පැය 1150

# මාධ්‍ය නිවේදනය

## 01. නීති විරෝධී මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර

2023.10.03 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පැලියගොඩ පොලිස් වසමේ කැළණිය බියගම ප්‍රදේශයේදී හදිසි මාර්ග බාධකයක් යොදා වැටලීමක් සිදුකර **නීති විරෝධීව අයිස් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 400, කුෂ් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 800, ඇෂ් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 500 ක් කේරළ ගංජා ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 640 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා **පැලියගොඩ** පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ පෙතියාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.

2023.10.04 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පැලියගොඩ පොලිස් වසමේ ගොඩකඳුරවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **නීති විරෝධීව අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 4 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා **පැලියගොඩ** පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. බලපත්‍ර නොමැතිව කලපුවක් ගොඩ කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අක්කරපත්තුව කඳවුර.

2023.10.04 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අක්කරපත්තුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අක්කරපත්තුව පොලිස් වසමේ පාමංග පාර, කලපුව අසල දී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ටිපර් රථ දෙකකින් පස්**

**පුරවා කලපුවක් ගොඩ කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන වැඩිදුර විමර්ශන සඳහා අක්කරපත්තුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන ඇල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** අක්කරපත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව ත්‍රී රෝද රථයකින් මත්පැන් ප්‍රවාහන කරන ලද සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.**

2023.10.04 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තෙල්දෙණිය පොලිස් වසමේ මහවැලි වික්ටෝරියා නිවාස සංකීර්ණය අසලදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව නීති විරෝදී ලෙස රජයේ අනුමත අරක්කු බෝතල් 164 ක් ත්‍රී රෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන වැඩිදුර විමර්ශන සඳහා තෙල්දෙණිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 43 හා 51 ක් වන කෙන්ගල්ල හා රජවැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. තෙල්දෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව අනවසරයෙන් කැබ් රථයකින් දැව ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2023.10.04 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඕමන්ත පොලිස් වසමේ රම්බෙකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව අනවසරයෙන් කැබ් රථයකින් දැව ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වැඩිදුර විමර්ශන සඳහා තෙල්දෙණිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන කනගරායන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ. ඕමන්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**